# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1371/23 – 2004 දෙසැම්බර් 16 වැනි බ්‍රහස්පතින්දා – 2004.12.16

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස – පළාත් සභා

### පළාත් සභා නිවේදන

මධ්‍යම පළාත් සභාව

1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය

7 වන වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, අධ්‍යාපන, ප්‍රවාහන, ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ධීවර, ග්‍රාමීය කර්මාන්ත ග්‍රාම සංවර්ධන හා අමාත්‍යාංශයක් යටතට නොගැනෙනු සියළුම විෂයයන් සම්බන්ධ අමාත්‍ය සරත් ඒකනායක වන මම පහත සඳහන් පිරිවැටුම් බදු අනුප්‍රමාණයන් මෙම නියෝගය මගින් 2004 දෙසැම්බර් 31 දින මධ්‍යම රාත්‍රියෙහි/2005 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් නියම කරමි.

| | | |
|---|---|---|
| (අ) | රත්‍රං, මුතු, මැණික්, වටිනා හෝ අර්ධ වශයෙන් වටිනා ගල් හා අනගි ලෝහ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ආ) | ස්වර්ණාභරණ හා ඇඳුම් ආයිත්තම් සඳහා වූ ස්වර්ණාභරණ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඇ) | උණ බම්බු, පොල් ලී, ඉරන ලද ලී හෝ කොට වශයෙන් දැව විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඈ) | කැබිනට්ටු, පේප්පු හා කාර්යාල ගෘහභාණ්ඩ ඇතුළුව ලී, ලෝහ හෝ ෆයිබර් ග්ලාස් වලින් තැනූ ගෘහ භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඉ) | අරක්කු, (පදම් කළ අරක්කු, කලවම් අරක්කු ඇතුළුව) බීර, වයින්, රා හා වෙනත් ආනයනික හෝ මෙරට නිෂ්පාදිත මත්පැන් වර්ග විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඊ) | සිගරට් නිෂ්පාදකයා වෙතින් හෝ සිගරට් ආනයනකරු වෙතින් හෝ මිළදී ගෙන සිගරට් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (උ) | ආනයනික පහත දැක්වෙන භාණ්ඩ හා ද්‍රව්‍ය ; | |
| | පිඟන් භාණ්ඩ, පිඟන් ගඩොල්, නානකාමර හා වැසිකිළි සවිකුරු හා උපකරණ, වීදුරු, වීදුරු භාණ්ඩ සහ ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |

| | | |
|---|---|---|
| (ඌ) | ආනයනික පහත දැක්වෙන භාණ්ඩ හා ද්‍රව්‍ය ;<br>කැමරා, ජංගම දුරකථන, ව්‍යායාම් උපකරණ, ශීතකරණ (අධි ශීතකරණ, බෝතල් සිසිල්කරණ, ජල සිසිල්කරණ, අයිස්ක්‍රීම් සාදන යන්ත්‍ර සහ වෙනත් ශීතකරණ ඇතුළුව) වායු සමීකරණ යන්ත්‍ර, රෙදි සෝදන යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර, ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර සහ ප්‍රති නිෂ්පාදන, රූපවාහිනී යන්ත්‍ර, රූපවාහිනී ප්‍රතිබිම්බ හා ශබ්ද පටිගත කිරීමේ යන්ත්‍ර හා ප්‍රති නිෂ්පාදන, වෙනත් විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ඒවායේ උපාංග හා කොටස්, විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (එ) | මාර්ගවල පාවිච්චි කිරීම සඳහා අදහස් කරන ලද හෝ අනුවර්තිත, ට්‍රැක්ටරය හෝ ට්‍රේලරය ඇතුළු යන්ත්‍රානුසාරයෙන් ධාවනය කරන (මෝපෙඩය, අවමංගල්‍ය රථ, ආබාධිතයන් සඳහා වූ රථය, සම්පූර්ණ වශයෙන් හෝ ප්‍රධාන වශයෙන් තැනැත්තන් ගෙනයාම සඳහා සාදා ගන්නා ලද මෝටර් ට්‍රයිසිකලය සහ ආසන විසිහයට වැඩි බස් රථ හැර) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලබන හෝ නොලබන සියළු මෝටර් වාහන, මෝටර් සයිකල් සහ මට්ටම් කිරීම, මඩ කැණීම, පස් ඉවත් කිරීම, කැලෑ වැවීම හෝ ඒ සමාන යම් කටයුත්තක් වැනි කෘෂිකාර්මික හෝ ඉදිකිරීමේ කාර්යයන් සම්බන්ධයෙන් ගොඩබිම පාවිච්චි කිරීම සඳහා අදහස් කරන ලද රෝද සහිත හෝ රහිත යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කරනු ලබන ඉඩම් වාහනද ඇතුළු මෝටර් වාහන සහ යන්ත්‍ර විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඒ) | ඉහත (අ), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (ඌ) සහ (එ) යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් මිළයට ගෙන විකිණීමේ ව්‍යාපාරවල පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 01 |

02. ඉහත කී මුදල් ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ සාදන ලදුව 1990 දෙසැම්බර් 28 වැනි දින සහ අංක 642/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියෝගය සහ එම නියෝගයට කරන ලද සංශෝධන 2004 දෙසැම්බර් මස 31 දින මධ්‍යම රාත්‍රියෙහි/2005 ජනවාරි මස 01 දින සිට මෙම නියෝගය ක්‍රියාත්මක වීමෙන් පසුව උද්ගත වන යම් පිරිවැටුමක් සම්බන්ධයෙන් අදාළවීම අහෝසි විය යුතුයි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, අධ්‍යාපන, ප්‍රවාහන,
ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා කටයුතු, ධීවර, ග්‍රාමීය කර්මාන්ත, ග්‍රාම සංවර්ධන හා
අමාත්‍යාංශයක් යටතට නොගැනෙන සියළුම විෂයයන් සම්බන්ධ අමාත්‍ය.

2004 දෙසැම්බර් මස 08 වැනි දින,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
මහනුවර.

12-888

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.